


# මහ බැංකු වාර්තාවෙන් රටට කරන අනතුරු ඇඟවීම

## ආර්ථික විග්‍රහය

> ත්‍රස්තවාදී ප්‍රහාරවල දී අහිමි වන්නේ ජීවිත හා දේපොළ හෙයින් හැබෑවී අත්විඳින නමුත් ආර්ථික ප්‍රහාරවලින් සිදුවන හානිය ජනතාවට දැනෙන්නේ නැත. ලෝක වෙළෙඳපොළේ රුපියල් තිස්පහක් පමණ වන සීනි කිලෝවක් ජනතාව මිල දී ගන්නේ රුපියල් සියයකටය. අතරමැද විශාල බද්දක් තිබේ. එහෙම වෙන්නේ මෙම ආර්ථික ප්‍රහාර හෙයින්ය.

ශ්‍රී ලංකා මහා බැංකුව සිය 2018 වාර්ෂික වාර්තාව නිකුත් කර තිබේ. ආර්ථික වර්ධනය සියයට 3.2 ක් බව එහි දක්වයි. එය [illegible]න ප්‍රතිශතයකි. නිදහස ලැබීමෙන් පසු ගත වූ කාලය තුළ සියයට පහක සාමාන්‍යයක් පවත්වාගෙන යන්නට සමත් වූ නමුත් මෑත වසර තුන එයට පහළින් ආර්ථිකය පැවැති ඇත. මෙම ස්වභාවය පරාජය කර මැදි කාලීන තිරසාර ආර්ථික වර්ධනයක් අත් පත් කර ගැනීම සඳහා ගත යුතු ක්‍රියාමාර්ග ගණනාවක්

ලද වර්ධනය වූ සියයට 3.4 සමග සසඳන විට සුළු වශයෙන් පහත වැටීමක් බව නිරීක්ෂණය කළ හැකිය. පශ්චාත් යුද කාල පරිච්ඡේදයේදී ශ්‍රී ලංකාවේ ආර්ථිකය ශීඝ්‍ර වර්ධනයක් පෙන්නුම් කළේය. 2010 අවුරුද්දේ වර්ධනය සියයට 3.5ක් 2011 දී සියයට 8.2ක්, 2012 දී සියයට 6.3ක් සහ 2014 දී සියයට 7.3ක් වශයෙනි. පැරණි දත්ත අනුව 2014 වර්ධනය සියයට 7.8ක් නමුත් අලුත් දත්ත ක්‍රමය අනුව එය සැලකෙන්නේ සියයට 4.9ක් වශයෙන්ය. එම තත්ත්වයටත් වඩා පහතට 2018 අවුරුද්දේ ආර්ථිකය පත්වන්නේ කාගේ වරදින්ද? ලෝක බැංකුව වතාවක් දකුණු ආසියාවේ වේගවත්ම ආර්ථික වර්ධනයක් සනිටුහන් කරන රටක් වශයෙන් ශ්‍රී ලංකාව හැඳින්විය. 2002-13 කාලයේ වර්ධනයේ සාමාන්‍යය සියයට 6.3ක් වූ අතර 2000 වසරේ දී ඒක පුද්ගල ආදායම ඇමෙරිකානු ඩොලර් 859ක සිට 2013 අවුරුද්දේදී ඇමෙරිකානු ඩොලර් 3,526 දක්වා ඉහළට නැග තිබේ. 2018 වසරේදී ඒක පුද්ගල ආදායම ඇමෙරිකානු ඩොලර් 4,102කි. 2000 සිට

කාර්යක්ෂමව පාලනය නොකරන්නේ ඇයි? රජයේ වියදම් අවම කිරීම ගැන හිතන්නේ නැත. පාර්ලිමේන්තුවේ පහසුකම්, මැති ඇමැතිවරුන්ගේ අමාත්‍යාංශ පිරිවැය, ආරක්ෂක වියදම්, නාස්තිය හා දූෂණය පෙන්වන්නේ ආදායම් ගලා යන වැසිය නොහැකි වී ඇති සිදුරු හැටියටය.

මහ බැංකු වාර්තාව පෙන්වා දෙන පරිදි කෘෂි අංශය දළ දේශීය නිෂ්පාදිතයට දක්වන දායකත්වයේ වර්ධනය සියයට 4.8 කි. කෘෂි අංශය කලින් වසරට වඩා සියයට 10.2ක පිම්මක් පෙන්වයි. 2017 වර්ෂයේ කෘෂිකර්ම අංශය 2016 වසරට වඩා සියයට 0.7ක පහත වැටීමක් තිබුණ අතර එය අභිභවා නැගී සිටීමට හේතුව වැදගත්ය. යහපත් කාලගුණය හා රජයේ පොහොර සහනාධාරය එයට දායක වී තිබේ. කෘෂි අංශයට රසායනික පොහොර අත්හැරීමට කරන ලද පෙළඹවීම බලවත් පීඩාවක් වූ අතර පසුව එය ආපසු හැරවීම එනම් පනවා තිබූ බාධක ඉවත්වීම රටට යහපතක් දැයි සාකච්ඡා කළ යුතුව තිබේ. ඉදිකිරීම් මන්දගාමී වීම හේතුකරගෙන කර්මාන්ත අංශයේ වර්ධනය 0.9කි. සේවා අංශයේ වර්ධනය 4.7ක පමණ වී තිබේ. ආණ්ඩුව කියන මහා පරිමාණ කර්මාන්ත හා මහා පරිමාණ ආයෝජනය ගැන මෙතැනින් ඇඟ වෙන්නේ නැත. සලකා බැලිය යුතු කාරණාවකි.

2015 අවුරුද්දේ විරැකියා අනුපාතය සියයට